www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කම්කරුවන් සඳහා සමාජවාදී ඉදිරිදර්ශනයක්

**A socialist perspective for public sector workers in Sri Lanka**

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)**

**2009 නොවැම්බර් 03**

වැටුප් වැඩිකිරීම සහ සේවා තත්ත්වයන් රැකගැනීම උදෙසා දැන් ඇරඹී ඇති රාජ්‍ය අංශයේ කාර්මික ආරවුල් දෙක පැනනැඟී ඇත්තේ ජීවන තත්ත්වයන් දැවැන්ත පිරිහීමට තුඩු දී ඇති ආන්ඩුවේ සාගිනි පිලිවෙත්වලට එරෙහිව කම්කරුවන් අතර පැතිර ගිය පුලුල් අතෘප්තියේ ප්‍රතිඵලයක් ලෙස ය.

ලංකා විදුලිබල මන්ඩලයේ ඒකාබද්ධ වෘත්තීය සමිති පෙරමුන පසුගිය ඉරිදා රුපියල් 5,000ක මාසික අතුරු දීමනාවක් පිලිබඳ ඉල්ලීම ඉදිරියට ගෙන යාම සඳහා සාමාජිකයින්ගේ රැස්වීමක් පැවැත්විය. මෙම රුපියල් 5,000 ඉල්ලීම ආන්ඩුව විසින් දැනටම ප්‍රතික්ෂේප කරඇති වඩා පුලුල් වැටුප් ඉල්ලීමක කොටසක් පමනි. මෙම රැස්වීමට ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ, වරාය අධිකාරියේ, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මන්ඩලයේ, වෘත්තීය සමිතිවල නියෝජිතයෝ ද සහභාගි වූහ. මෙම ආයතන ද සම්බන්ධ කර ගත් සීමිත අකුරට වැඩ ව්‍යාපාරයක් නොවැම්බර් 11 දා සිට ඇරඹීමට මෙහිදී තීන්දුවක් ගන්නා ලදී.

බ්‍රහස්පතින්දා රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති 17ක නියෝජිත සම්මේලනයක් පැවැත්වීමට නියමිත ය. මෙම රැස්වීමේ අරමුනු වන්නේ ගෙවීමට නියමිත වුවද මෙතෙක් ගෙවා නැති රුපියල් 3,158ක හිඟ ජීවන ආධාර මුදල ලබා ගැනීම ද ප්‍රධාන වැටුප් විෂමතාවන් ගනනාවක් ඉවත් කිරීම ද වේ. මෙම වෘත්තීය සමිති 17ට සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානය, තැපැල් හා විදුලි සංදේශ නිලධාරින්ගේ සංගමය, ලංකා ගුරු සංගමය, ආන්ඩුවේ මුද්‍රන ශිල්පීන්ගේ සංගමය, දුම්රිය ඒකාබද්ධ වෘත්තීය සමිති පෙරමුන හා ආන්ඩුවේ එක්සත් කම්කරු සම්මේලනය ඇතුලත් ය.

සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියට පහත සඳහන් බරපතල අනතුරු හැඟවීම කර සිටී. මෙම වෘත්තීය සමිති දැන් ඉදිරිපත් වී සිටින්නේ ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් මගින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම අරමුනු කරගෙන නොවේ. ඒවා ඉදිරිපත් වී සිටින්නේ දැන් මුලු රට පුරාම රාජ්‍ය අංශයේ සහ පුද්ගලික අංශයේ යන දෙකෙහිම පැතිර ගියා වූ ද ගැඹුරටම මුල් බැසගත්තා වූ ද කම්කරුවන්ගේ කෝපය රඳවා හිරකොට නිවා දැමීම සඳහා ය. මෙයින් වෘත්තීය සමිති බොහොමයක් විරුද්ධ පක්ෂයේ පක්ෂවලට - එනම් ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සහ එක්සත් ජාතික පක්ෂයට (එජාප) - අනුබද්ධ ඒවාය. මෙම පක්ෂ දෙකටම ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව සමග ඇති මූලික ප්‍රශ්න පිලිබඳව මොනම වෙනසක් හෝ ඇත්තේ නැත.

මුදල් ඇමති පදවිය ද දරන ජනාධිපති රාජපක්ෂ කියා සිටින්නේ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට එරෙහිව තමා ගෙන ගියා වූ වර්ගවාදී යුද්ධය විසින් ද ශ්‍රී ලංකාවේ අපනයනයන්ට බරපතල

පහරක් එල්ල කර ඇති භූගෝල පරිමාන පසුබෑස්ම විසින් ද පැන නංවන ලද ආර්ථික අර්බුදයේ බර ට වැඩ කරන ජනතාව කරගැසිය යුතුය කියා ය. පසුගිය මැයි මාසයේ දී එල්ටීටීඊ සංවිධානය පරජයට පත්කරන ලදී. එහෙත් කලින් එල්ටීටීඊය අල්ලා ගෙන තිබූ උතුරු-නැගෙනහිර ප්‍රදේශ තුල සඳහටම පැලපදියම් වී සිටීම සඳහා සූදානම් වන ආන්ඩුව හමුදාව තවතවත් පලල් කරමින් සිටී.

තියුනු ගෙවුම් ශේෂ අර්බුදයකින් ගැලවී ගැනීම සඳහා පසුගිය ජූලියේ දී ඩොලර් බිලියන 2.6ක නයක් හිඟාගෙන ගිය ආන්ඩුව දැන් මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටු කරමින් සිටී. දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 5ක් දක්වා අයවැය හිඟය කප්පාදු කිරීම ද බදු ඉහල දැමීම ද ලංකා විදුලි බල මන්ඩලය සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාව යනාදී රාජ්‍ය අයිතියකින් යුතු ආයතනයන් හි පාඩු මකා දැමීම ද මීට ඇතුලත් ය.

මෙම පියවරයන්හි අනිවාර්ය ප්‍රතිඵලය වනවා ඇත්තේ කම්කරුවන්ගේ ජීවන මට්ටම්වලට එනම් වැටුප් රැකියා සහ සේවා තත්ත්වයන් ට තවතවත් දරුනු පහර එල්ල කිරීම ය. 2006 පටන් රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම යටපත්කල රාජපක්ෂ දැන් මේ අවුරුද්දේ වැටුප් හා රැකියා වැඩිවීම් මුලුමනින් ම හිරකර දමා ඇත. මේ අතර ආන්ඩුව විසින් කප්පාදු කර දමා ඇති ජීවන වියදම් දර්ශකය පවා 2006 ජනවාරියේ 141 සිට 2009 ඔක්තෝබරයේ 207 දක්වා සියයට 50 කින් ඉහල නැග තිබේ.

පසුගිය ඉරිදා රැස්වීම් සංවිධානය කල ලංකා විදුලිබල මන්ඩලයේ ඒකාබද්ධ පෙරමුන මෙහෙයවනු ලබන්නේ ජනතා විමුක්ති පෙරමුනට සම්බන්ධ ලංකා විදුලිබල සංගමය (ලංවිසේස) විසිනි. මෙම රැස්වීමට එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධ ජාතික සේවක සංගමය (ජේඑස්එස්) ද සහභාගි විය. මේ සියලු වෘත්තීය සමිති යුද්ධයට සහාය දුන් ජවිපෙ සහ එක්සත් ජාතික පක්ෂයේ පිලිවෙත්වලට අනුව යුද්ධ පිලිවෙත් ඉදිරියට ගෙනයාමට උදව් වීම සඳහා වැටුප් කප්පාදු කිරීමට ආධාර කලහ.

මෑතක ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ පොදු සේවක සංගමයේ නායක ඩී.ජේ. රාජකරුනා මෙසේ ප්‍රකාශ කලේය: "මෙම රුපියල් 5,000 වැටුප් දීමනාව ගෙවිය යුතුව තිබුනේ ජනවාරි මාසයේ සිට වුව ද රටේ පැවති යුද තත්ත්වය නිසා වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට නොබැස සිටීමට අපි තීන්දු කලෙමු. දැන් යුද්ධය අවසන් ය. එහෙත් වැටුප් වැඩි නොකර සිටීමට දක්වන්නා වූ හේතු අප පිලිගන්නේ නැත."

එහෙත් රාජකරුනා සහ ඔහුගේ වෘත්තීය සමිතිය අනුබද්ධව සිටින්නේ ජනතා විමුක්ති පෙරමුනට ය. ජනතා විමුක්ති පෙරමුන යුද්ධයට සහයෝගය දුන්නා මෙන්ම උතුරු නැගෙනහිර පලාත් නිල වශයෙන් දිගින් දිගට ම අල්ලා ගෙන සිටීමට ද යුද කඳවුරුවල 250,000ක් රඳවාගෙන තැබීමට ද සහයෝගය දෙයි. ඔක්තෝබර් 20 වන දා ජනතා විමුක්ති පෙරමුන සහ එක්සත් ජාතික පක්ෂය රුපියල් බිලියන 34ක් වූ අමතර යුද වියදම් සඳහා පාර්ලිමේන්තුවේ දී ඡන්දය ප්‍රකාශ කලහ. මෙම රුපියල් බිලියන 34 ගත වූ වර්ෂයේ අයවැය ලේඛනයෙන් යුද වියදම් සඳහා දැනටමත් වෙන් කර ඇති රුපියල් බිලියන 200ට අමතරව ය..

එසේ ම එක්සත් ජාතික පක්ෂය ද ජනතා විමුක්ති පෙරමුන ද ජූලි මස ලංකාවට දෙන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් නයෙහි විවිධ අංග විවේචනය කරන නමුත් නය ගැනීමට ද ඒ අනුව කෙරෙන කප්පාදු පියවරයන්ට ද ප්‍රතිපත්තියානුකුල විරුද්ධත්වයක් නොදක්වති. එපමනක් නොව යූඅන්පී නායකයකු වන රවි කරුනානායක, "පුද්ගලික අංශ

වලින් නය ගැනීම වෙනුවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යා යුතු යයි ආන්ඩුවට කියා සිටියේ එක්සත් ජාතික පක්ෂය යයි" පම්පෝරියක් ද ගැසීය. "නාස්තිය සහ දූෂනය" ගැන මේ පක්ෂ දෙකම ආන්ඩුව විවේචනය කරති. එහෙත් ඔවුහු වර්තමාන ආර්ථික අර්බුදයේ මුල වනාහී ලාභ ගරන ධනපති ක්‍රමය ම බව පෙන්වා නොදෙති.

පුදුමයක් නොවේ, තමන්ගේ උද්ඝෝෂන ව්‍යායාමය ආරම්භ කිරීමට පෙර ම මොවුහු පස්ස ගැසීම අරඹා ඇත්තාහ. පසුගිය සතියේ තම ඉල්ලීම් දිනා ගැනීම සඳහා දින තුනක වැඩ වර්ජනයකට දින නියම කල ලංකා විදුලිබල මන්ඩලයේ වෘත්තීය සමිති ඉරිදා වන විට තම සැලැස්ම අකුරට වැඩ කිරීමක් දක්වා දියාරු කලේය. ජනතා විමුක්ති පෙරමුනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හා වෘත්තීය සමිති නායකයෙක් වන කේ.ඩී. ලාල්කාන්ත, "මෙම ප්‍රශ්න මිත්‍ර ශීලීව විසඳා ගැනීම සඳහා ගැටලු ඉක්මනට විසඳ දෙන ලෙස" ජනාධිපතිවරයාට යාඥා කලේ ය.

නොවැම්බර් 5 නියෝජිත සම්මේලනය කැඳවා තිබෙන රාජ්‍ය අංශයේ වෘත්තීය සමිති 17ට ද ඊට වඩා වෙනස් ඉදිරිදර්ශනයක් ඇත්තේ නැත. මෙම වෘත්තීය සමිති විසින් නිකුත්කරන ලද පත්‍රිකාවක් "රාජ්‍ය සේවකයන්ට සහන ලබා දෙන මෙන්" ජනාධිපති රාජපක්ෂට බැගෑපත්වී ඇත.

ඒ සමග ම 2010 අයවැය ලේඛනය මගින් රාජ්‍ය සේවකයන්ට සහන ලබා දෙන බවට ආන්ඩුව දුන් පොරොන්දුව අතහැර දැමීම ගැන ද එම සමිති රාජපක්ෂට දොස් කියා ඇත.

මෙම වෘත්තීය සමිතිවලින් බොහොමයක් 2006 රාජ්‍ය සේවා වැටුප් සමාලෝචන වෘත්තීය සමිති කමිටුවේ හවුල්කරුවන් වූ බව මෙහිදී මතක් කර ගතයුතු ය. එම කමිටුව සියයට 65ක වැටුප් වැඩි කිරීමක් ද වැටුප් විෂමතා ඉවත් කිරීමක් සඳහා මීට සමාන ඉල්ලීම් රාජපක්ෂට ඉදිරිපත් කලේ ය.

එසේ කිරීම මගින් යුද ප්‍රයත්නයට බාධා කරන්නේ යයි ආන්ඩුව වෘත්තීය සමිතිවලට චෝදනා කල වහාම තම ව්‍යායාමය අතහැර දැමූ වෘත්තීය සමිති පෙරමුන, "පවත්නා තත්ත්වය අරගල කිරීම සඳහා සුදුසු එකක් නොවේ යයි" කියා සිටියේ ය.

අද වඩාත් දරුනු ආර්ථික අර්බුදයකට මුහුන දෙන ආන්ඩුවට කම්කරුවන්ට සහන ලබා දීමේ කිසිම චේතනාවක් ඇත්තේ නැත. ඇත්ත වශයෙන්ම ඊලඟ අවුරුද්දේ නියමිත මැතිවරනය පවත්වන තෙක් වඩාත් දරුනු පියවරයන් කල්තැබීම අරමුනු කොට ගෙන 2010 අයවැය ලේඛනය කල් තැබීමට ආන්ඩුව දැනට ම පියවර ගෙන ඇත. පසුගිය සතියේ ලංකා ඛනජ තෙල් සංස්ථාවේ වෘත්තීය සමිති නියෝජිතයන් හමුවී සාකච්ඡා කිරීම කෙලින්ම ප්‍රතික්ෂේප කල ජනාධිපති රාජපක්ෂ විදුලි බල, ඛනිජ තෙල්, ජලසම්පාදන සහ ජලාපවාහන හා වරාය වෘත්තීය සමිති රට අස්ථාවර කිරීමට ක්‍රියා කරන්නා වූ "කුමන්ත්‍රන කාරයන්" යැයි හංවඩු ගැසීය.

වැටුප් වැඩි වීමක් ඉල්ලා සිටින කම්කරුවන්ට විරුද්ධව රාජපක්ෂ විසින් යුද්ධයේ භාෂාවෙන් කථාකිරීම අහම්බයක් නොවේ. කම්කරු පන්තිය පාලනය කර දීමට වෘත්තීය සමිති අසමත් වන්නේ නම් ආන්ඩුව කරනු ඇත්තේ 26 අවුරුදු යුද්ධයක් මගින් තහවුරු කරනු ලැබූ ප්‍රජාතන්ත්‍ර වීරෝධී බලතල ද පොලිස් රාජ්‍ය තන්ත්‍රය ද කම්කරුවන්ට එරෙහිව පාවිච්චි කිරීම ය. මේ වන විටත් රාජපක්ෂ ගත වූ අවුරුද්දේ කිහිප වතාවක් ම සන්නද්ධ හමුදාවන් වැඩ වර්ජන බිඳින්නන් ලෙස ද යොදාගෙන ඇති අතර එම වැඩ වර්ජනවලට විරුද්ධව දරුනු හදිසි නීති බලතල පාවිච්චි කරන බවට තර්ජනය කර ඇත. එසේ වුව ද

මේ වෘත්තීය සමිතිවලට නායකත්වය දෙන දේශපාලන පක්ෂ සෑම මාසයක දී ම මෙම හදිසි නීති බලතල සම්මත කර රාජපක්ෂගේ අතට දීම සඳහා අත ඔසවති.

පසුගිය ඉරිදා පැවැත්වුනු රැස්වීමේ දී ලංකා විදුලි බල මන්ඩලයේ බිල්පත් නිලධාරින්ගේ සංගමයේ නායක ප්‍රියන්ත වික්‍රමසිංහ මෙම ව්‍යායාමය මොනම ආකාරයකින් හෝ ආන්ඩුවට විරුද්ධව එකක් යයි කීමට විරුද්ධත්වය දැක්වීය. මෙම වෘත්තීය සමිතිය අනුබද්ධව පවතින්නේ සුලුධනේශ්වර විරෝධතා පක්ෂයක් වූ නව සමසමාජ පක්ෂය සමග ය. වික්‍රමසිංහ මෙසේ කීවේ යඃ "අප යෙදී සිටින්නේ ආන්ඩුව හෙලීමේ අරගලයක නොවේ. ආන්ඩුව වැටුනොත් අපට කරන්නට දෙයක් නැත. අපට ඕනෑ පඩි වැඩිකිරීමකි."

ප්‍රශ්නය මීට වඩා පැහැදිලි ලෙස මතු කල නොහැකිය. රාජපක්ෂගේ ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් කරන්නේ නැතුව වැටුප් වැඩි කිරීමක් බඳු ඉතාම මූලික ඉල්ලීමකට පවා සටන් කිරීම කම්කරුවන්ට කල නොහැකි තත්ත්වයක් උදාවී තිබේ. පාර්ලිමේන්තු වන්දනාවේ කන්නාඩිය තුලින් බලන වික්‍රමසිංහ වත්මන් ආන්ඩුවට එකම විකල්පය ලෙස දැකගන්නේ ජවිපෙ සහ යූඇන්පී යන දෙක ය. අද අවශ්‍යව ඇත්තේ සමාජවාදී පිලිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් ගොඩනැගීමට සටන් වැදීම ය.

මෙවන් අරගලයක් කිරීමට නම් කම්කරුවන් වෘත්තීය සමිති වලින් ද ඒවා බැඳී ඇති දේශපාලන පක්ෂ වලින් ද මුලුමනින් ම බිඳී වෙන්වීම අවශ්‍ය ය. වගකීම කම්කරුවන් තමන්ගේ  අතට ගතයුතු යයි ද වෘත්තීය සමිතිවලින් ස්වාධීන වූ ක්‍රියා කාරී කමිටු ගොඩනැගිය යුතු යයි ද සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී. රටපුරා පිහිටුවන මෙවන් කමිටුවල නියෝජිතයන් තම ඉල්ලීම් සඳහා තීන්දු ගැනීමට ද එම ඉල්ලීම් සඳහා සටන් කිරීමට දේශපාලන සහ කාර්මික අරගල ව්‍යායාමයක් සකසා ගැනීමට ද තමන්ගේම සම්මේලනයක් කැඳවා ගත යුතු ය.

සමාජවාදී ජාත්‍යන්තරවාදය එවන් ව්‍යායාමයක කේන්ද්‍රීය ඉදිරිදර්ශනය විය යුතු ය. දශක 6කට වැඩි කාලයක් තිස්සේ ආන්ඩු එකකට පස්සේ එකක් කම්කරු පන්තිය භේද කිරීමට ද ධනේශ්වර පාලනය ට මුක්කු දීමට ද දෙමල විරෝධී වර්ගවාදය යොදා ගත්හ. යුද ගැටුම අවසන්ව ඇති නමුත් උතුර හා නැගෙනහිර දිගින්දිගට යටත් කොට තබා ගැනීම සඳහා හමුදාව තව තවත් පලල් කෙරේ. කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීමේ එකම මග නම් මෙම භේදකාරී වර්ගවාදයට සහ ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්ට එරෙහි වීම ය. සියලු දෙමල සිවිල් ජනයා වහාම නිදහස් කරන ලෙස ද මිලිටරිය උතුරෙන් හා නැගෙනහිරින් කොන්දේසි විරහිතව ඉවත් කරන ලෙසද කම්කරුවන් කියා සිටිය යුතු ය.

කම්කරුවන්, ගම්බද දුප්පත් ජනයා සහ තරුනයන්ට ධනවාදයේ රාමුව තුල යහපත් ජීවන තත්ත්වයක් ලබාගැනීමට නොහැකිය. ධනවත් අතලොස්සකගේ ලාභ නොව බහුතරයේ හදිසි සමාජ අවශ්‍යතාවයන් දිනාගැනීම සඳහා, සමාජය උඩ සිට පහලට ප්‍රති සංවිධානය කල යුතුය. එම කටයුත්ත ඉටු කිරීමට නම් කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් ගොඩනැගිය යුතුව ඇත. සමාජවාදී සමානතා පක්ෂය දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තරව සමාජවාදය සඳහා පෘථුල අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ සහ ඊලම් හි සමාජවාදී සමූහාන්ඩුවක් උදෙසා සටන්වදී. අපගේ ඉදිරිදර්ශනය අධ්‍යයනය කොට කම්කරු පන්තියේ  මහා පක්ෂය ලෙස සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැගීම සඳහා අප පක්ෂයට එකතු වන ලෙස අපි කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org